1st Place Winner
National Productivity
Award 2020

ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/03/06/03/05 (10) | ඔබේ අංකය<br>உனது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2023.07.13 |

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**දකුණු පළාත් සභා නිලධාරීන්ගේ ස්ථාන මාරු පරිපාටිය**

උක්ත කරුණ සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක SP/PSC/5/1/2A-3(159) හා 2023.06.20 දිනැති ලිපිය හා බැඳේ.

02. එකී ලිපිය මගින් දකුණු පළාත් සභා නිලධාරීන්ගේ ස්ථාන මාරු පරිපාටි කෙටුම්පත සඳහා 2023.06.14 දිනැතිව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව මා වෙත දැනුම් දී ඇත.

03. ඒ අනුව, දකුණු පළාත් ප්‍රධාන ලේකම් පත්වීම් බලධරයා වන දකුණු පළාත් සභාවේ කළමනාකරණ සේවා නිලධාරී/ සංවර්ධන නිලධාරී/ වැඩසටහන් සහකාර/ සංවර්ධන සහකාර/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර/ රියදුරු/ කාර්යාල සේවක සේවය යන සේවාවන්හි නිරත නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීමට අදාළ **"දකුණු පළාත් සභා නිලධාරීන්ගේ ස්ථාන මාරු පරිපාටිය" ප්‍රධාන ලේකම් කාර්යාලයීය නිල වෙබ් අඩවියට (www.cs.sp.gov.lk) මුදා හැර ඇති බවත්, 2023.06.14 දින සිට එම ස්ථාන මාරු පරිපාටිය ප්‍රකාර ව ස්ථාන මාරුවීම් සිදුකළ යුතු බව කාරුණික ව** දන්වා සිටිමි.

04. තවද, නිලධාරීන් විසින් ස්ථාන මාරු අයදුම් කිරීමේදී හා අභියාචනා ඉදිරිපත් කිරීමේදී නිසි අයදුම්පත් ප්‍රකාර ව නිසි නිල මගින් අදාළ අයදුම්පත් ඉදිරිපත් කළ යුතු බව ද, නියමිත පරිදි ඉදිරිපත් නොකරන අයදුම්පත් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද කාරුණික ව සිහිපත් කරමි. මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැනගැනීමට අවශ්‍ය වන්නේ නම් **0914944010, 0914946365** හෝ **0914946971** අමතා තොරතුරු විමසිය හැකි ය.

05. එසේම, මා විසින් නිකුත් කරන ලද අංක 02/2022 හා 2022.02.11 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛය (පාලන) ප්‍රකාර ව, මෙම ස්ථාන මාරු පරිපාටියේ මුද්‍රිත පිටපත් දකුණු පළාත් සභාවේ සියලු ආයතන වෙත යොමු නොකරන බැවින්, **ප්‍රධාන ලේකම් කාර්යාලයීය නිල වෙබ් අඩවියේ භාගත කිරීම් වලට පිවිස ස්ථාන මාරු යටතේ "දකුණු පළාත් සභා නිලධාරීන්ගේ ස්ථාන මාරු පරිපාටිය"** භාගත කර ගැනීමට හා එම ස්ථාන මාරු පරිපාටිය ප්‍රකාර ව ස්ථාන මාරුවීම්වලට අදාළ කටයුතු සිදුකරන ලෙස ඔබ අමාත්‍යාංශයට/ දෙපාර්තමේන්තුවට අයත් අනෙකුත් සියලුම ආයතනවල නිලධාරීන් වෙත දැනුම් දීමට පියවරගන්නා ලෙස කාරුණික ව දන්වා සිටිමි.

**සුමිත් අලහකෝන්,**
**ප්‍රධාන ලේකම්,**
**දකුණු පළාත.**

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office: 091 4119011, 091 2234052
ෆැක්ස් / பெக்ஸ் / Fax: 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail: chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site: www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"සෞභාග්‍යමත් දකුණු පළාතක්"